# බුද්ධ ප්‍රතිමා වන්දනානිශංස: තථාගතබිම්බකාරාපණ සූත්‍රය ඇසුරින්

පූජ්‍ය දොඩම්කුඹුරේ ධම්මදස්සී හිමි

**ප්‍රවේශය**

මහායාන සූත්‍රාංශයක් වන තථාගතබිම්බකාරාපණ නමැති මූලාශ්‍රය සාධකයෙහි නිරූපිත බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමෙහි සහ එයට වන්දන පූජනාදිය සිදු කිරීමෙන් ලැබිය හැකි ආනිශංස පිළිබඳ විමසීම මෙහි අරමුණ වෙයි. ඒ බව මෙහි අවසානයට යෙදෙන **බුද්ධප්‍රතිමා-පුණ්‍යඵල-සමුදය-විභූති-මහාත්වප්‍රකාශනම් ඉදං සූත්‍රම්** යන්නෙන් පෙනේ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය පාලි ත්‍රිපිටකයෙහි මෙන් ම සංස්කෘත භාෂාවෙන් සංරචිත පිටක ග්‍රන්ථයන්හි ද සුරක්ෂිත වී ඇති බව එම ක්ෂේත්‍රය ඇසුරින් සිදු වී ඇති පර්යේෂණ විග්‍රහ විමර්ශන ආදියෙන් ප්‍රකට වී ඇත. කෙසේ වුව ද වර්තමානය දක්වා ම ඇතැම් ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ විශ්වාසය වන්නේ පිවිතුරු බුදු දහම සුරක්ෂිත වී ඇත්තේ පාලි ත්‍රිපිටකයෙහි පමණකි යන්න යි. එසේ වුව ද සත්‍යය එය නො වේ. තථාගත සද්ධර්මය භාරතයෙහි උතුරු දෙසට සහ දකුණු දෙසට ව්‍යාප්ත වීමේ දී භූගෝලීය සාධක සහ ඊට ප්‍රධානත්වය සැලසූ බෞද්ධ ආචාර්යවරයන්ගේ ඊප්සාවන්ට අනුව යම් යම් විචල්‍යයන් සිදු වූ බව සත්‍යයකි. එසේ වුව ද බුදු දහමෙහි ප්‍රකාශ වන මූලික දාර්ශනික සංකල්පයන් මෙකී උභය සම්ප්‍රදායයන්හි ම සුරක්ෂිත වීමෙන් ම අනුල්ලංඝණීය වී ද පවතිනු නිරීක්ෂණය කළ හැකි ය. තව ද මහායාන සම්ප්‍රදායයට අයත් සංස්කෘත බසින් හා ටිබෙට් බසින් ලබා ගත හැකි මූලාශ්‍රයයන් වෙතින් ගිලිහුණු ඇතැම් සූත්‍ර ප්‍රදේශයන් පාලි ත්‍රිපිටකයෙහි සුරක්ෂිත වී තිබෙනු ද පාලි ත්‍රිපිටකයෙන් ගිලිහුණු ඇතැම් සූත්‍ර ප්‍රදේශයන් මහායාන සම්ප්‍රදායයට අයත් කෘතිවල සුරක්ෂිත වී තිබෙනු ද දක්නට ලැබේ. මෙයින් පළමුවැන්නට නිදර්ශනයක් ලෙස දීඝනිකායෙහි වන ජාලිය සහ මහාලි යන සූත්‍රද්වය මහායාන ග්‍රන්ථයන්හි අවිද්‍යමාන වීම දැක්විය හැකි ය. එසේ ම දෙවැන්නට නිදර්ශනයක් ලෙස මජ්ඣිමනිකායෙහි වෙඛනස්ස සූත්‍රයෙන් ගිලිහුණු ඇතැම් කොටස් මහායාන සම්ප්‍රදායයෙහි මධ්‍යම ආගම කෘතියෙහි වන වෙඛනස්ස සූත්‍රයෙහි සුරක්ෂිත වී තිබීම සඳහන් කළ හැකි ය. එහෙයින් මෙහි දී ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයනයේ දී විද්‍යාර්ථියා විසින් සිදු කළ යුතු ප්‍රඥාගෝචර ක්‍රියාවලිය වන්නේ මෙකී උභය සම්ප්‍රදායයන් ම සාවධානව අධ්‍යයනයට නතු කරමින් ඒවාහි නිර්දිෂ්ට කරුණු අපක්ෂපාතී ලෙස තුලනයට ලක් කරමින් විද්වත් ලෝකය වෙතට නිරාවරණය කිරීම යි.